www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# සසප ශ්‍රී ලංකා ආන්ඩුවේ එල්ටීටීඊ තහනමට විරුද්ධ වෙයි

## SEP opposes Sri Lankan government's ban on LTTE

**සමාජවාදී සමානතා පක්ෂය (ශ්‍රී ලංකාව) විසිනි**

**2009 ජනවාරි 24**

දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයට එරෙහිව ශ්‍රී ලංකා ආන්ඩුව පනවා ඇති තහනම දේශපාලන විරුද්ධවාදීන් ද වඩා පුලුල් වසයෙන් ගත් කල කම්කරු පන්තිය, තරුනයන් හා පීඩිත ජනයා ද මත කඩා පැනීම සඳහා ඇති කර ගැනෙන සූදානමක් බව සමාජවාදී සමානතා පක්ෂය (සසප) අනතුරු අඟවා සිටී.

එල්ටීටීඊයට එරෙහිව හමුදාව මෑතදී ලබාගත් ජයග්‍රහන සාමය හා සෞභාග්‍යය සඳහා මාවත සකසනවා නොවේ. ජනාධිපති මහින්ද රාජපක්ෂ සූදානම් වන්නේ, දිවයිනේ වැඩෙන ආර්ථික හා සමාජ ගැටලු මගින් පැන නැංවෙන මහජන විරුද්ධත්වයට එරෙහිව මිලිටරිවාදී විධික්‍රම යොදා ගැනීමටයි.

ජනවාරි 7 දා නිවේදනය කල තහනම එල්ටීටීඊය මත සෘජු බලපෑමක් ඇති නොකරයි. ආන්ඩුව දැනටමත් මෙම දෙමල බෙදුම්වාදී ව්‍යාපාරයට එරෙහිව යුද්ධයක් ගෙන යමින් සිටී. එපමනක් නොව, දැනටමත් බලපැවැත්වෙන හදිසි නීති බලතල යටතේ සිය ගනනක් "එල්ටීටීඊ සැකකරුවන්" ලෙස නඩු විභාගවලින් තොරව රඳවා ගෙන සිටී.

"ත්‍රස්තවාදයට" එරෙහිව සටන් කිරීමේ කඩතුරාව යටතේ, නව ආඥාපනත රාජ්‍යයට පුලුල් බලතල ලබාදෙයි. "එල්ටීටීඊයට සම්බන්ධිත හෝ එය නියෝජනය කරන හෝ එය වෙනුවෙන් ක්‍රියා කරන . . . එබැවින් රාජ්‍ය ආරක්ෂාවේ අවශ්‍යතාවන්ට, මහජන සාමය පවත්වා ගෙන යාමට සහ ප්‍රජා ජීවිතයට අත්‍යවශ්‍ය සැපයුම් හා සේවා පවත්වා ගෙන යාමට හානිකර බවට පත්ව ඇති සෙසු සංවිධාන" තහනම් කිරීමට ද එය විධිවිධාන සපයයි.

එල්ටීටීඊයට සහයෝගය දෙන පාර්ලිමේන්තු දේශපාලන පක්ෂයක් වන දෙමල ජාතික සන්ධානයට (ටීඑන්ඒ) එරෙහිව මෙම රෙගුලාසි වහාම යොදා ගත හැකිය. කෙසේවෙතත්, එවන් පුලුල් අර්ථකථන, දේශපාලන පක්ෂ, වෘත්තීය සමිති හෝ ශිෂ්‍ය සංවිධාන ඇතුලු, ආන්ඩුවේ විරුද්ධවාදීන් ලෙස සැලකෙන, ඕනෑම සංවිධානයක් සඳහා යොදා ගත හැකි ය. ඒ යටතේ නියම කල හැකි දඬුවම් අතරට පුද්ගලයන් සඳහා වසර 20ක් දක්වා වන සිර දඬුවම් සහ සංවිධානවල දේපොල හා අරමුදල් රාජසන්තක කිරීම ද ඇතුලත් වේ.

රාජපක්ෂ ආන්ඩුව සිය විවේචකයන්, වර්ජක කම්කරුවන්, විරෝධතා දක්වන ශිෂ්‍යයන් හා ගොවීන් "කොටි හිතවාදීන්" ලෙස හංවඩු ගැසීම සම්බන්ධයෙන් කුප්‍රකට ය. පසුගිය තුන් වසරක කාලය තුල ප්‍රමුඛ ටීඑන්ඒ දේශපාලනඥයන්, මාධ්‍යවේදීන් හා දෙමල තරුනයන් ඇතුලු, සිය ගනනක්, මිලිටරියට සම්බන්ධිත ඝාතක කල්ලි විසින් "අතුරුදහන්" කරනු ලැබ හෝ අමුඅමුවේ ඝාතනය කරනු ලැබ ඇත. මේ මස මුල දී, ආන්ඩුව සම්බන්ධයෙන් විවේචනශීලී වූ සන්ඩේ ලීඩර් පත්‍රයේ කර්තෘ ලසන්ත වික්‍රමතුංග, රැකියාව සඳහා සිය මෝටර් රථයෙන් යමින් සිටිය දී මහ දවල් වෙඩි තබා ඝාතනය කරන ලදි.

රාජපක්ෂ සහ ඔහුගේ ඇමතිවරු යුද ප්‍රයත්නයට වල කපන්නන් ලෙස වර්ජකයන් විශේෂයෙන් ම හෙලා දැක තිබේ. පසුගිය ජූලි මස වැඩි වැටුප් ඉල්ලා ලක්ෂ ගනනක් කම්කරුවන් එක් දින වැඩ වර්ජනයක නිරත වූ විට, ආරක්ෂක ප්‍රකාශක කෙහෙලිය රඹුක්වැල්ල ප්‍රකාශ කලේ, වැටුප් ඉල්ලීම් ලබා දුන හොත් මිලිටරි වියදම් කපා දැමීමට සිදු වනු ඇති බවයි, එය එල්ටීටීඊයට අවශ්‍ය දෙය බවයි. "ඒ නිසා මේ දෙක (වෘත්තීය සමිති සහ එල්ටීටීඊය) අතරේ යම් සම්බන්ධතාවක් තියෙන්න පුලුවන්."

සිංහල ස්වෝත්තමවාදී ජාතික හෙල උරුමයේ නායක උදය ගම්මන්පිල, තහනමේ පුලුල් පරාසය අවධාරනය කලේ, එහි එල්ලය "එල්ටීටීඊයේ අරමුනට වක්‍රව හා සෘජුව සහයෝගය දෙන " එල්ටීටීඊ-ගැති ක්‍රියාකාරකම්වලට වැට බැඳීම බව පවසමිනි. "ත්‍රස්තවාදීන්ට මූල්‍යමය හා මතවාදී ලෙස සහයෝගය දෙන එවන් කොටස් පරාජය කිරීම අපට තීරනාත්මක යි." හෙල උරුමය රාජපක්ෂගේ පාලක සභාගයේ කොටස්කරුවෙකි.

සිය වර්ගෝත්තමවාදී යුද්ධයත් එය හා බැඳුනු ප්‍රජාතන්ත්‍ර විරෝධී විධික්‍රමත් යුක්තියුක්ත කරනු පිනිස, රාජපක්ෂ යොදා ගන්නේ, ඇෆ්ඝනිස්ථානයේ හා ඉරාකයේ තම නව-විජිතවාදී යුද්ධ සඳහා බුෂ් පාලනාධිකාරය ඉදිරිපත් කල ව්‍යාජ කඩතුරාවන් ම ය. නිල නිවේදනයට අනුව

එල්ටීටීඊය තහනම් කලේ, උතුරේ හා නැගෙනහිර වෙනම රාජ්‍යයක් ගොඩනැගීම පිනිස “ත්‍රස්තවාදී ක්‍රියාවල හා සෙසු ප්‍රචන්ඩ ක්‍රියාවල යෙදීම්”, සන්නද්ධ හමුදා සමග නීති විරෝධී සන්නද්ධ ගැටුමක නිමග්න වීම සහ “අවි බිම තබා, යටත් වී ප්‍රජාතන්ත්‍ර ක්‍රියාදාමයට සහභාගි වීමට” අපොහොසත් වීම හේතු කොටගෙනය.

ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීම පිලිබඳ ආන්ඩුවේ කියාපෑම් මුලුමනින්ම ව්‍යාජය. 1983 දී යුද්ධය පැන නැංගේ ම අනුප්‍රාප්තික ආන්ඩු රටේ දෙමල සුලුතරයට එරෙහිව ගෙන ගිය ක්‍රමානුකූල වෙනස්කම් කිරීමේ පිලිවෙත නිසා ම ය. 2006 මැද දී රාජපක්ෂ එල්ටීටීඊයට එරෙහිව යුද්ධය යලි දියත් කලේ, දිවයිනේ සිංහල බහුතර ප්‍රභූවේ අධිපති ආර්ථික හා දේශපාලන තත්වය සහතික කරගනු පිනිස ය.

එල්ටීටීඊය ත්‍රස්තවාදී සංවිධානයක් නොවේ. උතුරේ හා නැගෙනහිර දෙමල ජනයා සඳහා වෙනම ධනපති රාජ්‍යයක් පිලිබඳ එහි ඉල්ලීම නියෝජනය කරන්නේ, දෙමල ධනේශ්වරයේ කොටසක අවශ්‍යතා ය. “ත්‍රස්තවාදය” යනු සිය යුද්ධයේ ප්‍රතිගාමී වර්ගෝත්තමවාදී එල්ලයන් ආවරනය කරගනු පිනිස රාජපක්ෂ ආන්ඩුව විසින් යොදා ගනු ලබන පදයක් පමනි. එල්ටීටීඊය ත්‍රස්තවාදී යයි හෙලා දකින ආන්ඩුව ම, හිතුවක්කාරී අත්අඩංගුවට ගැනීම්, ඝාතක කල්ලි සහ සිවිල් ප්‍රදේශ මත ඉවබවක් නැතිව එල්ල කෙරෙන ෂෙල් හා බෝම්බ ප්‍රහාර මගින් දෙමල සුලුතරය ත්‍රස්ත කිරීම සම්බන්ධයෙන් වගකිව යුතුය.

එල්ටීටීඊ තහනම නිවේදනය කරමින් නිකුත් කල සිය ආඥාවේ දී, රාජපක්ෂ වොෂිංටනයේ “ත්‍රස්ත විරෝධී යුද්ධය” සිය සේවය සඳහා කැඳවා ගත්තේ, මෙසේ ප්‍රකාශ කරමිනි: “ත්‍රස්තවාදය නමැති වසංගතය ලෝකයෙන් තුරන් කර දමනු සඳහා සියලුම ස්වෛරී රාජ්‍ය ත්‍රස්තවාදය අපරාධයක් බවට නම් කොට ත්‍රස්තවාදී ක්‍රියාවල නිරත වන සංවිධාන සියල්ලම එකක් වත් බැහැර නොකර තහනම් කිරීම අවශ්‍ය ය.”

තහනම පනවන ලද්දේ, ශ්‍රී ලංකා හමුදාව එල්ටීටීඊයේ පරිපාලන මධ්‍යස්ථානය වන කිලිනොච්චියේ පාලනය අල්ලා ගැනීමෙන් යන්තම් දින කිහිපයකට පසුව ය. තමන් “එල්ටීටීඊය සමග සාකච්ඡා ඉල්ලා” නොසිටින බව ප්‍රකාශ කරමින් කොලඹ එක්සත් ජනපද තානාපති කාර්යාලය ජනවාරි 7 දා නිකුත් කල නිවේදනයක් මගින් එක්සත් ජනපදය යුද්ධයට සිය විවෘත සහයෝගය සංඥා කලේය. කලින් යුරෝපා සංගමය, නෝර්වේ සහ ජපානය සමග එක්ව, එක්සත් ජනපදය, “සාම සාකච්ඡාවල” සහ 2002 සටන් විරාමයේ ජාත්‍යන්තර අනුග්‍රාහකයන් ලෙස ක්‍රියා කලේය.

අනාගත සාකච්ඡා සඳහා පවතින මොන යම් හෝ හැකියාවක් තථ්‍ය ලෙස බැහැර කරමින්, එක්සත් ජනපද නිවේදනය, ශ්‍රී ලංකා ආන්ඩුවේ තහනමට කොල ආලෝකය සම්පාදනය කලේය. ශ්‍රී ලංකාවේ ආරක්ෂක මන්ඩලය -- ජනාධිපති, ආරක්ෂක ලේකම්, ජනාධිපති ලේකම් සහ සන්නද්ධ හමුදා ප්‍රධානීන් -- රැස්වී තහනම ගැන තීන්දුව ගත් අතර ඉන් පසුව එදිනම එය කැබිනට් මන්ඩලය හරහා තල්ලු කරන ලදි.

එක්සත් ජනපදයේ සැප්තැම්බර් 11 ප්‍රහාරයන්ට පසුව සම්මත කර ගැනුනු අංක 1373 දරන එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මන්ඩලයේ යෝජනාව යටතේ එල්ටීටීඊයට එරෙහිව ජාත්‍යන්තර තහනමක් පනවනු පිනිස රාජපක්ෂ දැන් ප්‍රයත්නය දරයි. එල්ටීටීඊය ත්‍රස්තවාදී සංවිධානයක් ලෙස ලැයිස්තුගත කරනු පිනිස එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල් පොලඹවා ගැනීමේ ප්‍රයත්නයක ආන්ඩුව යෙදී සිටින බව ජනවාරි 12 දා ඩේලි මිරර් පත්‍රය වාර්තා කලේය. ලොව වටා සිටින සැලකිය යුතු විශාලත්වයකින් යුක්ත දෙමල විදේශගත ප්‍රජාව තුල එල්ටීටීඊයට පවතින මොන යම් හෝ සහයෝගයක් මත දැඩි සීමාවන් පැනවීමට එවන් පියවරක් යොදා ගැනෙනු ඇත.

කිලිනොච්චියේ හමුදා ජයග්‍රහනයට වලකැපීමේ “කුමන්ත්‍රනයක්” පිලිබඳව ආන්ඩුව තර්ජනාත්මක අනතුරු ඇඟවීමක් කර තිබේ. දේශප්‍රේමී උත්සව සංවිධානය කිරීමේ හා වාර්ගික ආතතීන් අවුලුවාලීමේ එහි ප්‍රයත්න බොහෝ සෙයින් එය බලාපොරොත්තු වූ සාර්ථකත්වය අත්පත් කර ගැනීමට අසමත්ව ඇත. යුද්ධය අවසාන වසයෙන් හමාර වනු ඇතැයි වැඩ කරන ජනතාව තුල බලාපොරොත්තු තිබිය හැකි නමුදු, 25 වසරක යුද්ධයේ ප්‍රතිඵලයක් ලෙස තමන්ට දැරීමට සිදුව ඇති දැවැන්ත දුෂ්කරතා පිලිබඳව ඔවුහු මැනවින් දනිති.

පෙබරවාරි 14 දා පැවැත්වෙන පලාත් සභා දෙකේ මැතිවරන සඳහා තරඟ වැදීමේ දී, ආන්ඩුවේ වර්ගවාදී යුද්ධයට කිසිඳු වැනීමකින් තොරව විරුද්ධ වන්නා වූ ද සියලු වැඩ කරන ජනතාවගේ -- දෙමල, මුස්ලිම් සහ සිංහල -- ප්‍රජාතන්ත්‍ර අයිතීන් ආරක්ෂා කරන්නා වූ ද එකම පක්ෂය සමාජවාදී සමානතා පක්ෂය යි. ප්‍රධාන විපාර්ශ්වික පක්ෂ දෙක ම -- දක්ෂිනාංශික එක්සත් ජාතික පක්ෂය (එජාප) සහ සිංහල අන්තවාදී ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) -- එල්ටීටීඊය තහනම් කිරීමට සහයෝගය දී තිබේ. තථ්‍ය වසයෙන් ගත් කල, ජවිපෙ එම තහනම පනවන ලෙස ආන්ඩුවට බල කරමින් සිට ඇත.

විරුද්ධත්වයේ සෑම රූපාකාරයකට ම එරෙහිව ආන්ඩුව විසින් යොදා ගැනෙන අත්තනෝමතික විධික්‍රමයන්ට විරුද්ධව ආස්ථානයක් ගන්නා ලෙස කම්කරුවන්ගෙන්, තරුනයන්ගෙන් හා බුද්ධිමතුන්ගෙන් අපි ඉල්ලා සිටිමු. රාජපක්ෂ යෙදී සිටින්නේ, ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු “ප්‍රජාතන්ත්‍රවාදයේ” සීමිත රූපාකාරයන් පවා ආරක්ෂා කිරීමේ නොව, එම ආයතන හිස් කෝම්බයක් බවට ලඝු කොට පොලිස් රාජ්‍යයක රාමුව ගොඩනැගීමේ ය.

තහනමට විරුද්ධ වීමේ දී, සසප එල්ටීටීඊයට කිසිදු දේශපාලන සහයෝගයක් දෙන්නේ නැත. එම සංවිධානයේ දෙමල බෙදුම්වාදී වැඩපිළිවෙල පිළිබිඹු කරන්නේ, දෙමල කම්කරුවන්ගේ හා ගොවීන්ගේ අවශ්‍යතා නොව දෙමල ධනේශ්වරයේ අවශ්‍යතා ය. සාමාන්‍ය සිංහල වැසියන් මත එල්ටීටීඊය එල්ල කරන ප්‍රචන්ඩ ප්‍රහාර ආන්ඩුවේ සිංහල අධිපතිවාදයේ ප්‍රතිගාමී අරමුන ම වන ආගමික, ජනවාර්ගික හා භාෂාමය පදනම මත කම්කරු පන්තිය භේද කිරීම සඳහා සේවය කරන අතර කොලඹ සිංහල අන්තවාදීන්ගේ අත් ශක්තිමත් කිරීමට සෘජුවම දායක වේ.

සමාජවාදී ජාත්‍යන්තරවාදයේ ක්‍රියාමාර්ගය මත පදනම් වෙමින්. සසප ඉල්ලා සිටින්නේ, උතුරෙන් හා නැගෙනහිරෙන් ශ්‍රී ලංකා සන්නද්ධ හමුදා වහාම හා කොන්දේසි විරහිතව ඉවත් කරන ලෙස යි. මෙම ඉල්ලීම, දකුනු ආසියාවේ සමාජවාදී සමූහාන්ඩු සංගමයක කොටසක් ලෙස ශ්‍රී ලංකා-ඊලම් සමාජවාදී සමූහාන්ඩුවක රූපාකාරයෙන් කම්කරු-ගොවි ආන්ඩුවක් ස්ථාපිත කරනු පිනිස ආන්ඩුවට හා එල්ටීටීඊයට එරෙහිව දෙමල හා සිංහල කම්කරු පන්තියේ එකමුතුකම සඳහා අත්‍යවශ්‍ය පූර්ව-කොන්දේසියයි.

© www.wsws.org